**දික්වැල්ල ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 නොවැම්බර් 25 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 මාර්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) එකිනෙක සමාන වියයුතු ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය සහ ස්ථාවර වත්කම් ශේෂය අතර රු.200,000 ක වෙනසක් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු ආදායම, රු.306,290 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව වරිපනම් හා බදු ආදායම රු. 447,539 ක් ද, කුලී ආදායම් රු. 367,636 ක් ද වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල අතුළත් ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපලේඛන වල දැක්වෙන ශේෂ අතර එකතුව රු.317,589,827 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

වර්ෂ 03 කට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.368,036 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක්ද, රු.7,188,805 ක් වූ තැන්පතු ශේෂ 345 ක්ද පැවති නමුත්, එකී ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් එකතුව රු.159,690,373 ක් වූ ස්ථාවර වත්කම් ශේෂ 02 ක් සහ රු. 214,063,842 ක් වූ වගකීම් ශේෂ 02ක් පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

----------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ .

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 132 (ඒ) වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේදී උත්සව කටයුතු වෙනුවෙන් රු.149,985 ක වියදම් දරා තිබුණි.

(ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර රු.3,045,727 ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.20,227,667 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.2,248,182 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.17,979,485 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ මුළු පුනරාවර්තන ආදායම්, ස්වයං උත්පාදන ආදායම් සහ ආදායම් ආධාර මෙන්ම මුළු පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදිත ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 81,720,168 | 38,658,319 | 43,061,849 | 61,492,501 | (18,430,652) |
| 2014 | 49,361,315 | 25,028,320 | 24,332,995 | 47,113,133 | (22,780,138) |
| 2013 | 38,907,459 | 15,626,488 | 23,280,971 | 38,280,119 | (14,999,148) |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ ආදායම් ආධාර වල මෙන්ම සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම්වල ද සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය විය.

(ආ) සභාවේ ස්වයං උත්පාදන ආදායම ඉක්මවා වර්ෂ තුනෙහිම සැලකිය යුතු ඉහළ අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී තිබුණු නමුත්, එම තත්ත්වය පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) ආදායම් ආධාර නොලැබෙන්නට ස්වයං උත්පාදන ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් පෙන්නුම් කරනු ලැබේ.

(ඈ) ඉහත අංක (අ) සිට (ඇ) දක්වා ඡේදවල දැක්වෙන කරුණු අනුව ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීමට සභාවේ අවධානය යොමුවිය යුතුව ඇති බවත්, ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බවත්, එසේ නොමැති වුවහොත් සභාවේ මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පවතින දුර්වලතාවය හේතුවෙන් ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වියහැකි බවත්, එමගින් සභාවේ අඛණ්ඩ පැවැත්මට අහිතකර බලපෑම් එල්ලවිය හැකි බවත් නිරීක්ෂණය විය.

**2.3 ආදායම් පරිපාලනය**

-----------------------

**2.3.1 වරිපනම් බදු**

**-------------**

සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු. 2,599,127 ක් වූ හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.2 කඩ කුලී**

-----------

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,742,768 ක් වූ හිඟ කඩකුලී ශේෂයන් පැවතියද ඒ සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.3 උසාවි දඩ සහ මුද්දර ගාස්තු**

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.755,829 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.32,038,429 ක් ලැබිය යුතුව තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්ය සාධන ඇගයීම**

--------------------------

**3.1.1 යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභා අරමුදල් යොදවා ක්‍රියාත්මක කිරීමට සම්මත වී තිබුණු වැඩ යෝජනා 62 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.1.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

සමාලෝචිත වර්ෂයේදී පිරිවැය රු.33,302,447 ක් වූ ඇස්තමේන්තු 57 ක් පිළියෙල කර තිබූ නමුත්, වර්ෂය තුළ ඉන් කර්මාන්ත 17 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

### 3.2.1 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 06 ක් හා අතිරික්ත සංඛ්‍යාව 25 ක් වූ නමුත්, පුරප්පාඩු පුරවා ගැනීමට හෝ අතිරික්ත සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2.2 සේවක ණය

---------------

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 8,575,674 ක් වූ සේවක ණය ශේෂය තුළ වර්ෂ 07 කට වැඩි කාලයක සිට අය නොවී පවතින එකතුව රු.56,623 ක් වූ ශේෂ 02 ක් ඇතුළත්ව තිබුණි.

## 04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

### 4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 04 ක එකතුව රු.1,239,110 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, තවත් වියදම් විෂයන් 04 ක එකතුව රු. 13,902,161 ක් වූ ප්‍රතිපාදන සීමා ඉක්වීම් දක්නට ලැබුණි.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

----------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### 4.3 වත්කම් කළමනාකරණය

------------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

සභාවට අයත් පිරිවැය රු.2,000,000 ක් වූ ලොරි රථයක් හා රු.425,000 ක් වූ ට්‍රැක්ටරයක් 2015 වර්ෂයේ සිට අක්‍රීයව පවතින අතර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් 2015 පෙබරවාරි 07 දින පරිත්‍යාග ලෙස ලැබී තිබුණු මාර්ග තලනය ඌන උපයෝජිතව පැවතුණි.

**5. පද්ධති හා පාලනයන්**

-------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන  ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) සේවක මණ්ඩල
(ඉ) කළමනාකරණය